www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ කම්කරුවන් සඳහා ඉදිරි මාවත

## The way forward for Sri Lankan public sector workers

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2006 අප්‍රේල් 03**

ලක්ෂ සංඛ්‍යාත රාජ්‍ය අංශයේ කම්කරුවෝ ඉහල යන බඩු මිල යටතේ තමන්ට සහ තම පවුල්වලට ජීවත් වීමට සරිලන ආකාරයේ සියයට 65ක වැටුප් වැඩි වීමක් ඉල්ලා අද කාර්මික ක්‍රියාමාර්ගයකට එක් වෙති. තවත් බොහෝ කම්කරුවන් මෙන් ම නාගරික හා ගම්බද දුගී ජනතාව ද මෙම අරගලය දෙස බලා සිටින අතර ජීවන මට්ටම්වල අනවරත පල්ලම් බැසීම ආපසු හැරවීම පිනිස තමන්ට කල හැක්කේ කුමක්ද යන්න පිලිබඳ සිය සැලකිල්ල ද යොමු කරති.

කෙසේ වෙතත්, මෙම උද්ඝෝෂනය පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) හා එහි ක්ෂමාවිරහිත වෙලඳ පොල ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රයට එරෙහි පුලුල් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරනවා වෙනුවට, වෘත්තීය සමිති නායකයන් ආරම්භයේ පටන් ම ක්‍රියා කොට ඇත්තේ එය හිර කිරීමට හා සීමා කිරීමට යි. සමහර සමිති නායකයන් උද්ඝෝෂනයට සහභාගි වීම ප්‍රතික්ෂේප කොට එය කඩාකප්පල් කිරීමට ක්‍රියාකාරීව උත්සාහ කොට ඇත. තවත් අය "ගැටලුව විසඳීම" පිනිස තමන් ආන්ඩුව සමග වැඩ කරන බව කියමින් උද්ඝෝෂනයෙන් ඉවත් වී තිබේ.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) අනතුරු අඟවා සිටින්නේ එජනිස ආන්ඩුවට ආයාචනා කිරීමෙන් කිසිවක් ලබා ගත නොහැකි බව යි. අවශ්‍යව ඇත්තේ විප්ලවවාදී ඉදිරිදර්ශනයක් හා නායකත්වයකි. රාජ්‍ය අංශයේ කම්කරුවන් අවබෝධ කර ගත යුත්තේ, ඔවුන් යෙදී සිටින්නේ, ආන්ඩුවට එරෙහිව පමනක් නොව, එයට පිටුබලය සපයන සංගතවලට ද භූගෝලීය ප්‍රාග්ධනයේ ඒජන්සිවලට ද එරෙහිව යන දේශපාලන අරගලයක බව යි. සමාජවාදී පිලිවෙත්වල පදනම මත කම්කරු පන්තියේ හා පීඩිත ජනතාවගේ පුලුල්ම තට්ටු වෙත ඔවුන් ප්‍රවේශ විය යුතු ය.

දශක තුනක් තිස්සේ, අනුප්‍රාප්තික ආන්ඩු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ආඥාවන් ක්‍රියාවට දමා ඇත. රැකියා ලක්ෂ ගනනින් විනාශ කොට, රාජ්‍ය ව්‍යවසායයන් විකුනා දමා, සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය සේවාවන්ට වෙන් කෙරෙන මූල්‍ය ප්‍රතිපාදන කපා දමා, රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ වැටුප් හා කොන්දේසිවලට වල කපා තිබේ. තමන් "පොදු ජනයා වෙනුවෙන්" පෙනී සිටින බවට කරන ඔහුගේ කියාපෑම් තිබිය දී ම, ජනාධිපති මහින්ද රාජපක්ෂ ද ඔහුගේ පූර්ව-ප්‍රාප්තිකයන් මෙන් ම, මූලිකව යෙදී සිටින්නේ දිවයින විදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීමෙහි ය.

වත්මන් ආරවුල පැන නැංගේ, රාජ්‍ය අංශයේ ඉහල ශ්‍රේනිවලට සියයට 65ක වැඩිවීමක් ද රාජ්‍ය සේවකයන්ගේ අති මහත් බහුතරයට අතිශය සොච්චම් වැඩි වීමක් ද යෝජනා කරමින් සිය වැටුප් කොමිසම ඉදිරිපත් කල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආන්ඩුව උත්සාහ කිරීමත් සමග ය. මෙම අසහනය වර්ජන ක්‍රියාමාර්ගයක් ඉල්ලා සිටීම දක්වා වර්ධනය වූ කල රාජපක්ෂ කලේ, ඊලඟ අයවැයේ දී සැලකිල්ලට භාජනය කරනු පිනිස මාස නවයකින් "යෝජනා" ඉදිරිපත් කරනු සඳහා නව වැටුප් කොමිසමක් පත් කල බව නිවේදනය කිරීම යි. මෙය වනාහි උද්ඝෝෂනය නිෂ්ක්‍රීය කිරීමේ පාරදෘශ්‍ය උපායකට වැඩි යමක් නොවේ.

පරිපාලනය පිලිබඳ ජාතික මන්ඩලයේ ප්‍රධානි තිස්ස දේවේන්ද්‍ර මාර්තු 22 දා ඩේලි මිරර් පත්‍රයට කල අදහස් දැක්වීමක දී ආන්ඩුවේ සැබෑ ආකල්පය ප්‍රකාශයට පත් කලේය. "රාජ්‍ය අංශයට (වැටුප්) වැඩි කල විට අනෙක් අය ද වැඩි පුර ඉල්ලනු ඇත. මෙය සේවාවන්ගේ ගාස්තු ඉහල දමා රැලි ආකාර බලපෑමක් ඇති කරනු ඇත" යනුවෙන් ඔහු පැවසීය.

රාජ්‍ය අංශයේ වැටුප් ඉහල දැමීමක් ආන්ඩුවට දැරිය නොහැකි බව එයට මතක් කර සිටි ලෝක බැංකුවේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ පීටර් හැරල්ඩ්, ආන්ඩුව එම ආඥාවන් අනුගමනය නොකල හොත් ආධාර කපා දැමීමක් සිදු විය හැකි බව ද ඇඟවී ය. "ශ්‍රී ලංකාව බාහිර මූල්‍ය සම්පාදන මත උවමනාවට වඩා රදා පවතී. රාජ්‍ය වියදම්වලින් සියයට 50ක් ආධාර ඒජන්සි මගින්

සම්පාදනය කිරීමක් තාර්කික නැත." යැයි ඔහු ප්‍රකාශ කලේය.

කම්කරුවන්ට වත්මන් වෘත්තීය සමිති නායකත්වය මත විශ්වාසය තැබිය නොහැකි ය. "ස්වාධීන" වෘත්තීය සමිති 200ක පමන සන්ධානයක් වන රාජ්‍ය අංශයේ වැටුප් සමාලෝචන වෘත්තීය සමිති කමිටුව (රාඅවැසවෘසක) පැන නැංගේ, විවිධ දේශපාලන පක්ෂවලට සම්බන්ධිත වෘත්තීය සමිති පිලිබඳව පුලුල්ව පැතිර පවත්නා අපේක්ෂාභංගත්වය නිසා ය. මෙම නව සමිති තනි තනි වැඩ පොලවල කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් වැදීමට පොරොන්දු වී ඇත. එහෙත් ඔවුන්ගේ වාර්තා මගින් පෙනී යන්නේ එහි අනෙක් පැත්තයි.

මාර්තු 16 දා කම්කරුවන් 300,000ක් වර්ජනයට එක් වීම මගින් රාඅවැසවෘසක කම්පනයට ලක් කෙරුනි. එය මේ වෙන විටත් සියයට 65ක වැටුප් වැඩිවීමක් පිලිබඳ ඉල්ලීමෙන් පසු බසිමින් ඇත්තේ, "නව වැටුප් යෝජනා සකස් කෙරෙන තෙක්" රුපියල් 3000ක අතුරු මාසික දීමනාවක් ඒ වෙනුවට ඉල්ලා සිටිමිනි.

විරෝධය දැක්වීමක් ලෙස මාර්තු 30 දා පලාත් පාලන මැතිවරනවල දී ඡන්දය කටු ගැමේ යෝජනාවක් සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සන්ධානය (සෞසේවෘසස) සහ තැපැල් හා විදුලි සංදේශ සමිති ආරම්භයේ දී ඉදිරිපත් කල විට, රාඅවැසවෘසක තුල සිටින ආන්ඩුවට මෙන් ම විවිධ දේශපාලන පක්ෂවලට ද හිතවත් කොටස් එම ඉල්ලීමට එරෙහිව ක්ෂනිකව කඩා පැන්නේ ය.

"වැඩ කරන ජනතාව කිහිප දෙනෙකුගේ ඉල්ලීමකට යටත් විය යුතු නැත" යැයි පවසමින් රාජපක්ෂ ඡන්දය කටු ගැමේ යෝජනාව හෙලා දැක්කේය. මාර්තු 16 දා වර්ජනයට එක්වීම ප්‍රතික්ෂේප කල ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධිත සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනය (සලවෘසස) ඡන්දය කටු ගැම ආන්ඩුවට පමනක් නොව සෙසු පක්ෂවලට ද බලපානු ඇතැයි සඳහන් කරමින් එයට විරුද්ධ විය. කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධිත රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනයේ නායක ඩබ්ලිව්.එච්. පියදාස වැටුප් ඉල්ලීමට "සහයෝගය" දුන් නමුත් ඡන්දය කටු ගැමේ ඉල්ලීම හෙලා දකිමින් රාජපක්ෂව වගවර්නනා කලේ සිය පොරොන්දු "අකුරටම" ඉටු කරන පුද්ගලයකු ලෙස ය.

මෙම අඛන්ඩ ප්‍රහාරය හමුවේ සෞසේවෘසස සහ සෙසු සමිති අකුලා ගත්තේ ය. වැඩ කරන ජනතාවගේ පුලුල් ස්ථර අලලා ගන්නා ක්‍රියාකාරී ඡන්ද වර්ජනයක් ලෙස සිය කැඳවුම ඉදිරිපත් කිරීමේ අභිප්‍රායක් ඔවුන්ට කොහෙත් ම තිබුනේ නැත. ඒ එසේ වුවත්, රාජපක්ෂ සහ ඔහුගේ සගයන් භීතියට පත් වූයේ, මෙම උපක්‍රමය, සමස්ත දේශපාලන සංස්ථාපිතය ම පිලිබඳව පිලිකුලෙන් එයින් විරසකව සිටින ඡන්දදායකයන්ගේ පරිකල්පනය ඩැගැ ගෙන එජනිසයේ මැතිවරන අපේක්ෂාවන්ට හානි කරනු ඇතැයි යන්න ගැන ය.

අද විරෝධතාව පිලිබඳව තීන්දුව ගත් මාර්තු 26 දා නියෝජිත සම්මේලනයේ දී, රාඅවැසවෘසක නායකත්වය ආන්ඩුවට එරෙහි දේශපාලන අරගලයක් කෙරෙහි දක්වන සතුරු භාවය එලිමහනට පැමිනියේ ය. සෞසේවෘසස නායක සමන් රත්නප්‍රිය, සසප නියෝජිතයකු කල කතාවකට ප්‍රතිචාර දක්වූයේ, වර්ජනය තුල මතු වන දේශපාලන ප්‍රශ්න පිලිබඳ කිසිදු සාකච්ඡාවක් අනවශ්‍ය බව පවසා," අපට අවශ්‍ය විශාල ක්වෙල් කිරීමේ බලයක් ගොඩනැගීමටයි" යනුවෙන් ප්‍රකාශ කිරීමෙනි.

මොන තරම් විශාල වුවත් පෙනුමෙන් කොතරම් සටන්කාමී වුවත් සමාජවාදී ඉදිරිදර්ශනයකින් තොර වූ කල මෙම උද්ඝෝෂනය පරාජයට මුහුන දෙන බවට සසප පැහැදිලිව ම අනතුරු අඟවා සිටී. වෘත්තීය සමිති තුල "දේශපාලනය එපා" යැයි හඬ තලන නායකයන් සූදානම් වන්නේ සිය සාමාජිකයන් යලිත් වරක් අවෘත අන්තරයක් තුලට තල්ලු කිරීමට යි. දොරගුලු ලාගෙන කෙරෙන සාකච්ඡා තුල දී, ආන්ඩුවේ ඇමතිවරු හා රාජ්‍ය නිලධරයන් සමග ඇති තරම් දේශපාලනය ගැන කතා කෙරෙනු ඇත. එහෙත් ඒ කම්කරු පන්තියේ අවශ්‍යතා මත නොවේ.

1980 දී පැවති රාජ්‍ය අංශයේ අවසන් මහා වර්ජනයේ දී සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) මැදිහත්වීමට විරුද්ධව ද "දේශපාලනය එපා" යන මෙම සටන් පාඨය ම යොදා ගැනුනි. ලංකා සමසමාජ පක්ෂය (ලසසප), කොමියුනිස්ට් පක්ෂය සහ නව සමසමාජ පක්ෂය (නසසප) යන සියල්ලෝ ම, ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ ආන්ඩුවටත් එහි ආර්ථික ප්‍රතිසංස්කරන වැඩපිලිවෙලටත් එරෙහිව දේශපාලන අරගලයක් සඳහා විකොස කල ඉල්ලීමට දරුනු ලෙස එරෙහි වූහ. සේවකයන් 150,000ක් දොට්ට දැමීමට තුඩු දුන් එම ව්‍යසනකාරී පරාජයේ මිල රාජ්‍ය අංශයේ කම්කරුවෝ තවමත් ගෙවති.

ශිෂ්ඨ සම්පන්න වැටුප් හා කොන්දේසි වෙනුවෙන් රාජපක්ෂ ආන්ඩුවට එරෙහි උද්ඝෝෂනය සඳහා පදනම ලෙස පහත දැක්වෙන දේශපාලන වැඩපිලිවෙල සසප ඉදිරිපත් කර සිටී.

## ජාත්‍යන්තරවාදය

ලොව පුරා කම්කරුවන් හා තරුනයන් මුහුනු දී සිටින්නේ ද, සංගතවල ලාභ අවශ්‍යතා ආරක්ෂා කර

ගැනීමේ එල්ලයෙන් යුක්තව ජීවන මට්ටම් හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත අතොරක් නැතිව එල්ල වන මෙම ප්‍රහාරයන්ට ම ය. තරුන කම්කරුවන් හිතුමනාපේ දොට්ට දැමීමේ අවසරය ලබා දෙන ප්‍රථම රැකියා ගිවිසුම නම් වූ පනතට එරෙහිව දශ ලක්ෂ සංඛ්‍යාත ප්‍රන්ස කම්කරුවන් සහ තරුනයෝ මේ දිනවල අරගලයක නිරතව සිටිති. ජර්මනියේ රාජ්‍ය අංශයේ කම්කරුවෝ වැඩ පැය ගනන් දීර්ඝ කිරීමට එරෙහිව මාර්තු මුල වර්ජනය ක්‍රියාමාර්ගයකට අවතීර්න වූහ. පසුගිය සඳුදා, දශ ලක්ෂයක් වන බ්‍රිතාන්‍ය පලාත් පාලන කම්කරුවෝ විශ්‍රාම වැටුප් කප්පාදුවකට විරුද්ධව වැඩ නතර කලහ.

සෑම රටක ම, වැඩ කරන ජනතාවට කියා සිටින්නේ ඔවුන් "තම ජාතිය" වෙනුවෙන් කැප කිරීම් කල යුතු බව යි. එහෙත් ශ්‍රී ලංකාවේ කම්කරුවන්ගේ සහජ මිතුරා කොලඹ සංගත ප්‍රභූව නොව ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආඥාවන් තනි කුඩා දිවයිනක් තුල පරාජය කල නොහැකි ය. එයට ප්‍රතිකූලව, මෙය ඉල්ලා සිටින්නේ පුලුල් ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගොඩනැගීම යි.

## යුද්ධයට අවසානයක්

ශිෂ්ඨ සම්පන්න ජීවන කොන්දේසි සඳහා වන අරගලය රටේ ව්‍යසනකාරී සිවිල් යුද්ධයට පන්ති විසඳුමක් ගෙන ඒම සමග නොවැලැක්විය හැකි ලෙස බැඳී පවතී. රාජපක්ෂ ආන්ඩුව අවධාරනය කරන්නේ, තමන් රුපියල් බිලියන ගනනක් ආරක්ෂක වියදම්වලට වෙන් කරන බැවින් රාජ්‍ය අංශයේ වැටුප් සඳහා මුදල් නැති බව යි. ඔවුන් යලි යුද්ධයකට යන ලෙස උද්ඝෝෂනය කරන බැවින් ජවිපෙ තුල සිටින ආන්ඩුවේ ස්වෝත්තමවාදී සගයන් ඉල්ලා සිටින්නේ මිලිටරිය වෙනුවෙන් තව තවත් මුදල් වියදම් කරන ලෙස යි. රාජපක්ෂගේ "සාම සැලැස්ම" එකම කාසියේ විරුද්ධ පැත්ත යි. එනම්, වෙලඳ පොල ප්‍රතිසංස්කරන වේගවත් කිරීම සහ සියලු ශ්‍රී ලාංකික කම්කරුවන් එක සේ සූරාකෑම පිනිස දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග බලය බෙදා ගැනීමේ ගිවිසුමකට එලඹීම යි.

කම්කරු පන්තිය සිවිල් යුද්ධයට ස්වකීය විසඳුම ඉදිරිපත් කල යුතු ය. සිංහල. දෙමල සහ මුස්ලිම් කම්කරුවෝ, වාර්ගික දේශපාලනයේ භේදකාරී විෂ ප්‍රතික්ෂේප කොට සිය පොදු පන්ති අවශ්‍යතා වටා ඒකාබද්ධ විය යුතු ය. මෙම වර්ගවාදී යුද්ධයට එක මිනිසෙක් හෝ එක සතයක් හෝ නොදෙනු යන ඉල්ලීම මතු කල යුතු ය. පන්ති එකමුතුකම සඳහා පදනම තහවුරු කරනු පිනිස, කම්කරුවෝ, උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරනු යැයි ඉල්ලා සිටිය යුතු අතර දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන් වැදිය යුතු ය.

## කම්කරු-ගොවි ආන්ඩුවක්

කම්කරු පන්තිය පාලක පන්තියේ සියලු පක්ෂවලින් -- දක්ෂිනාංශික හා ඊනියා "වාමාංශික" -- සිය දේශපාලන ස්වාධීනත්වය තහවුරු කර ගෙන සමාජවාදී පිලිවෙත් මත පදනම් වන කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා ඉල්ලීම ඉදිරිපත් කල යුතු ය. ලාභ ගරන ක්‍රමයේ රාමුව තුල සහන ඉල්ලා ආන්ඩුවට බලපෑම් දැමීමට සීමා වන වෘත්තීය සමිති දේශපාලනයෙන් මුලුමනින් ම බිඳී ගැනීමක් මෙමගින් ඉල්ලා සිටී. වැටුප් හා ජීවන මට්ටම් පාලනය කිරීමේ බලය, සමාජයේ අති මහත් බහුතරයේ දැවෙන සමාජ අවශ්‍යතාවලට ඉදිරියෙන් සංගත ලාභ අවශ්‍යතා අනිවාර්‍යයෙන් ම තබන ධනපති රාජ්‍යය අතෙහි තැබීම, කමකරුවන්ට කල නොහැකි ය. මෙම අරගලයේ දී. කම්කරු පන්තිය, සහනාධාර කප්පාදුව සහ සේවාවන් නැතිකම ඇතුලුව, ආන්ඩුවේ පිලිවෙත්වල ප්‍රහාරයට එලෙසම මුහුන දී සිටින ගම්බද දුගීන් වෙත හැරීම අවශ්‍ය ය.

සියල්ලටමත් වඩා, මෙම දේශපාලන ක්‍රියාමාර්ගය සඳහා සටන ඉල්ලා සිටින්නේ, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සසප, කම්කරු පන්තියේ නව මහජන විප්ලවවාදී පක්ෂය ලෙස, ගොඩනැගීම යි. අප කම්කරුවන්ගෙන්. තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් ඉල්ලා සිටින්නේ. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙස යි, සසප හා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ක්‍රියාමාර්ගය අධ්‍යයනය කොට මෙම ජාත්‍යන්තර පක්ෂයට බැඳී එය ගොඩනගන ලෙස යි.